ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2012
--------------------------------------------

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම
----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිවිය.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 මතය ව්‍යාචනය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

---------------------------------

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස ඛාදනයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු. 25,538,505,650 ක සෘණ අගයක් ගෙන තිබූ අතර ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් ඇතිවී තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රමිති

--------------------

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

------------------------------------

I. ප්‍රමිතිය විසින් හඳුන්වාදෙනු ලැබූ ආකෘතිය පදනම් කරගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි.

II. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙර වර්ෂයේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

III. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන සෑම සටහනක්ම විස්තරාත්මකව ඉදිරිපත් කළයුතු වුවත් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

IV. ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව මණ්ඩලය විසින් ගිණුම් පිළියෙල කරනු ලබන්නේ ඓතිහාසික පිරිවැය මත වුවද සමාගමක කොටස්වල ආයෝජනය කරන ලද පිරිවැය රු. 250,000 ක්වූ ආයෝජන සාධාරණ අගය මත අගයකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ගිණුම් සටහන්වල හෙළිදරව් කර නොතිබුණි.

V. පෙර වර්ෂයට අදාළව ප්‍රාග්ධන අයිතමවල යම් වෙනස්කමක් සිදුකරයි නම් එම වෙනස්වීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනයට කරන ලද රු.මිලියන 637.85 වෙනස්වීම සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07
-----------------------------------

I. සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.මිලියන 141.13 ක් වූ ඉතිරිකිරීම් ගිණුම්වල ශේෂය මූල්‍ය ප්‍රකාශනවල මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ දැක්විය යුතු වුවත් ණය හා ලැබියයුතු ලෙස ආයෝජන යටතේ දක්වා තිබුණි.

II. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දැක්විය යුතු රු.මිලියන 293.85 ක් වූ කල්බදු පොළී සහ රු.මිලියන145.61 ක් වූ අනෙකුත් මූල්‍ය පිරිවැය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු අතර රු.මිලියන 511.33 ක් වූ රජයේ ප්‍රදාන ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත - 08
--------------------------------------

ප්‍රමිතියේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව හා හෙළිදරව් කිරීම් වලින් තොරව පහත සඳහන් පෙර කාලපරිච්ඡේදයන්ට අදාළ ගැලපීම් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි.

I. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ දැක්වෙන රු.මිලියන 1,189.78 ක් වූ පෙර වර්ෂයේ ගැලපීම්.

II. පෙර වර්ෂයට අදාළව රු.මිලියන73.38 ක දේපල පිරියත හා උපකරණවල පිරිවැය වෙනස් කිරීම් හා රු.මිලියන 182.03 ක් වූ සමුච්චිත ක්ෂය වෙන් කිරීම්වල සිදුකළ ගැලපීම්.

III. පෙර වර්ෂයට අදාළව සිදුකරන ලද රු.මිලියන 206.76 ක රජයේ ප්‍රදාන ගැලපීම්.

IV. පෙර වර්ෂය තුළදී මණ්ඩලය විසින් මිලදී ගත් රු.මිලියන 24.4 ක් වටිනා වාහන 06 ක් ප්‍රාග්ධනිත කිරීම.

V. පෙර වර්ෂය තුළදී රජයේ ප්‍රදාන මත ලැබූ බව හඳුනාගත් රු.මිලියන 14.92 ක් වටිනා බස්රථ 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී කරන ලද ගැලපීම්.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 16
---------------------------------------

I. මණ්ඩලය විසින් වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය නොකිරීමේ හා ඉවත් කරන වර්ෂය වෙනුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. ඒ අනුව වත්කම ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ප්‍රයෝජනවත් කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළයුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී මිලට ගන්නා ලද රු.මිලියන 1,264.25 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

II. මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණවලට අදාළව පෙර වර්ෂයේ ධාරණ වටිනාකම නිවැරදිව දක්වා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 17
---------------------------------------

I. මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වගකීම දැක්වීමේදී එම කල්බදු වත්කම්වල අවම සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය දැක්විය යුතු වුවද මණ්ඩලය විසින් කල්බදු වගකීම පිරිවැය මතද, පොළී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය(Sum of digit method) මතද ගණනය කර රු.මිලියන 1,066.12 ක් ලෙස කල්බදු වගකීම දක්වා තිබුණි.

II. කල්බදු සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

   i. සෑම කල්බදු වත්කම් වර්ගයක් සඳහාම අදාළ කාලපරිච්ඡේදය අවසානයට ශුද්ධ ධාරණ වටිනාකම.

ii. කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීමක්.

iii. පහත සඳහන් කාලපරිච්ඡේදයන්ට අදාළව ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව

- වසරකට නොඅඩු කාලයකට
- වසරකට වැඩි සහ වසර 05 කට අඩු
- වසර 05 කට වැඩි

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 18
------------------------------------

ස්ථාවර තැන්පත් සඳහා පොළී ගණනය කිරීමේදී සඵලතා පොළී අනුපාත ක්‍රමය මත (Effective interest rate method) ගණනය කළයුතු වුවද මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන උපචිත සංකල්පයට පටහැනිව මුදල් පදනම මත පොළී ගණනය කර ගිණුම් ගතකර තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 19
--------------------------------------

පාරිතෝෂික දීමනා වෙන්කිරීම ගණනය කිරීමේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාන ආයතන සඳහා අවසරදී ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගෙන ගණනය කළයුතු වුවත් මණ්ඩලය විසින් එක් එක් තනතුරු වල වැටුප් පරිමාණවල සාමාන්‍යය පදනම් කරගෙන ගණනය කර තිබූ අතර එක් එක් සේවකයාට අදාළව ගෙවිය යුතු පාරිතෝෂික මුදල දැක්වෙන වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙනිසා අනාගතයේදී ඇතිවිය හැකි අවදානම අවම කරගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ආයතනය මඟින් සැලසුම්කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 37
------------------------------------

අසම්භාව්‍ය වගකීම් වෙනුවෙන් වෙන්කිරීමක් හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් කළ යුතු වුවත්, ආයතනයට එරෙහිව ගොනුකර තිබූ නඩු 37 න් නඩු 06 කට අදාලව රු.මිලියන 11.08 ක් වන්දි ඉල්ලා තිබූ තිබුණත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් හෝ වෙන් කිරීමක් කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 39

I. ණය සහ ලැබියයුතු ශේෂ ජීවගණන පිරිවැය ක්‍රමය යටතේ (Amortized Cost) ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් මණ්ඩලය විසින් ආයෝජන ශේෂයන් පිරිවැය මත ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

II. ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල 300 කින් අයවිය යුතු වෙළඳ හා විවිධ ණයගැති ශේෂය රු.මිලියන 57.66 ක් වූ අතර ඉන් ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල 10 කින් පමණක් කාල විශ්ලේෂණ ලැබී තිබුණි. ඒවායින් සියයට 50 ක් පමණ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වුවත් මණ්ඩලය විසින් මෙම ණයගැතියන්ගේ අයකරගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂාවක් සිදුකර අයවීම අඩමානව ඇති ශේෂ වෙනුවෙන් අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලැබී තිබුණු වටිනාකම රු.මිලියන 4.95 ක් වූ සිංගල් කැබ් රථ 03 ක අගය ගිණුම්ගතවී නොතිබුණු අතර මෙම වාහන වෙනුවෙන් දරන ලද රු.මිලියන 1.48 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයහාර වියදමක් ලෙස ලියා හැර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් විකුණන ලද රු.මිලියන 3.98 ක ඉන්ධන තොග තවදුරටත් මාර්ගස්ථ තොග ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) වයඹ ප්‍රාදේශිකයට අදාළව මාර්ගස්ථ ඉන්ධන තොග ගිණුමේ රු.මිලියන 2.99 ක බැර ශේෂයක් දක්වා තිබුණි. මෙය ගිණුම්කරණ දෝෂයක් නිසා සිදුවී තිබුණද එම දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බස්රථ ගර්හිත කිරීම ගිණුම් තැබීම සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමයක් නොතිබීම හේතුවෙන් ගර්හිත කරන ලද එක් බස්රථයක පිරිවැය හා සමුච්චිත ක්ෂය අවස්ථා කිහිපයකදී ගර්හිත බස්රථ ගිණුමට හා ගර්හිත බස්රථ සමුච්චිත ක්ෂය ගිණුමට මාරුකර තිබුණි. නියැදි පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය තුළදී විකුණන ලද එවැනි

බස්රථ 04 ක් වෙනුවෙන් වැඩිපුර මාරුකර තිබූ පිරිවැය හා සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.මිලියන 5.17 ක් හා රු.මිලියන 5.16 ක් විය.

(ඉ) ක්‍රීඩා අරමුදලට සේවකයින්ගේ වැටුපෙන් අඩු කර තිබූ රු.මිලියන 12.5 ක් එම අරමුදල් ගිණුමේ සටහන් කිරීම වෙනුවට ජංගම වගකීම් යටතේ ගෙවියයුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

(ඊ) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් මණ්ඩලයට අයත් වැඩපලවල සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන අලාභය රු.මිලියන 187.56 ක් වූ අතර එයට අදාළ ගිණුම් සටහනට අනුව ඩිපෝ වලින් ලැබුණු මුළු ආදායම රු.මිලියන 236.03 ක් විය. ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේදී මෙවැනි අන්තර් ගණුදෙනු හිලව්කර ආදායම ඉක්මවූ වියදම පමණක් ප්‍රාදේශීය වැඩපල වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වාස ඇප රක්ෂණ අරමුදල් ආයෝජන රු.5,318,179 ක් වත්කම් ලෙස ගිණුම්වල දක්වා තිබුණද ඊට අදාල විශ්වාස ඇප රක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂය රු. 86,993 ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියයුතු වරිපනම් බදු හා ගෙවිය යුතු පාරිතෝෂික දීමනා පිළිවෙලින් රු.මිලියන 25.83 ක් හා රු.මිලියන 10.69 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඔ) ස්ථාවර නියෝග යටතේ හා බැංකුව විසින් සෘජුවම අයකරනු ලැබූ රු.මිලියන 3.17 ක බස්රථ ණය වාරික, බැංකු ගාස්තු, අයිරා පොළී හා චෙක්පොත් ගාස්තු ආදිය ගිණුම්ගතකිරීම වෙනුවට බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළදී කල්බදු පදනම මත මිලට ගත් රු.මිලියන 98 ක් වටිනා අධි සුඛෝභෝගී බස්රථ 10 ක් ගිණුම්ගත කිරීමේදී රු.මිලියන 97 ලෙස දැක්වීම නිසා බස්රථ ගිණුමේ ශේෂය රු.මිලියනකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) රු.මිලියන 4.0 ක් වූ ප්‍රාදේශීය වැඩපළ අවසාන තොගය ගිණුම්ගතකර නොතිබුණි.

(ග) 2005 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නැවත පිහිටවූ අවස්ථාවේදී ඒකාබද්ධ කරන ලද පොකුරු බස් සමාගම් 11 ක හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 11 කට අයත් ස්ථාවර වත්කම් පවරා ගැනීමේදී භෞතික සමීක්ෂණයකින් හා ප්‍රත්‍යාගණනයකින් තොරව එදිනට ක්ෂය අඩුකරන ලද රු.මිලියන 3,511.34 ක් ද රු.මිලියන 217.69 ක ජංගම වත්කම් ද රු.මිලියන 369.04 ක ජංගම බැරකම්ද පොත් අගයට පවරාගෙන තිබුණි. මෙම වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර මේ නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ස්ථාවර වත්කම්වල සාධාරණ අගය ගිණුම්වල නිරූපණය නොවීය.

(ජ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාව වන විට සම්පූර්ණයෙන්ම ලැබී තිබූ ගමන් බලපත් ආදායම් , හමුදා වාරිකා ආදායම්, පොලිස් වොරන්ට් පත්‍ර යන ආදායම්වල එකතුව වූ රු.මිලියන 633.11 මත සියයට 5 ක්වූ රු.මිලියන 31.66 ක මුදලක් අඩමාන ණය ලෙස වෙන්කර තිබුණි.

## 2.2.4 ක්‍රියාකාරී නොවන ශේෂ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිසි සුපරීක්ෂණයක් නොමැතිකම හා දුර්වල අභ්‍යන්තර පාලනය නිසා දීර්ඝකාලයක් තිස්සේ හඳුනා නොගත් හා නොසැසඳූ ගිණුම් ගණනාවක එකතුව රු.මිලියන 6,689.6ක හර ශේෂ හා රු.මිලියන 24,010.39 ක බැර ශේෂ විගණනය කිරීම සඳහා අවශ්‍ය විස්තර ඉදිරිපත් කර නොතිබුණි. මෙම ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හර ශේෂ වත්කම් ලෙසත් බැර ශේෂ වගකීම් ලෙසත් දක්වා තිබීම තුළින් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි තත්ත්වය නිරූපණය නොවීය. තවද මෙම ගිණුමේ පසුගිය වර්ෂය අවසාන බැර ශේෂය ලෙස රු.මිලියන 26,885.4 ක් ලෙස දක්වා තිබුණද ප්‍රවර්තන වර්ෂයේ ලෙජරය අනුව ආරම්භක බැර ශේෂය රු.මිලියන 1.9 කින් වැඩියෙන් දක්වා තිබුණි. ප්‍රවර්තන වර්ෂය තුළදී ද රු.මිලියන 53.84 ක හර ශේෂයක් ද රු.මිලියන 80.72 ක බැර ශේෂයක් ද මෙම ගිණුමට මාරු කර තිබුණි.

(ආ) රු.මිලියන 3,232.23 ක හර ශේෂ 66 ක් හා රු. මිලියන 2,010.92 ක බැර ශේෂ 23 ක් වූ නිශ්චල වත්කම් හා බැරකම් පිළිබඳව සම්පූර්ණ පරීක්ෂාවක් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම හා අනුමැතිය මත පොත්වලින් කපා හැරීමට 2002 ජූලි 30 දින

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දෙනු ලැබූ අනුමැතිය පරිදි එම වත්කම් හා වගකීම් පොත්වලින් කපාහැර තිබුණද ඒ පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව තොග ශේෂය රු. මිලියන 758.17 ක් වූ අතර ගබඩාවේ බින්කාඩ්පත් අනුව තොග ශේෂය රු. මිලියන 756.59 ක් වූයෙන් රු. මිලියන 1.58 ක්වූ වෙනසට හේතූන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විකුණන ලද ගර්හිත බස්රථවලට අදාළව ලාභාලාභ ගණනය කිරීමේදී පිරිවැය හා සමුච්චිත ක්ෂයවීම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 1,161.06 ක් හා රු.මිලියන 1,155.77 ක් ලෙස ගිණුම්වලට ගෙන තිබූ නමුත් ගිණුම් අංශයෙන් ලබාගන්නා ලද විකුණුම් ලේඛනයට අනුව එය පිළිවෙලින් රු.මිලියන 1,014.19 ක් හා රු.මිලියන 1,010.63 ක් ලෙස දක්වා තිබුණි. පිළිවෙලින් රු.මිලියන 146.87 හා රු.මිලියන 145.14 ක් වූ වෙනසට හේතූන් හෝ පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ විකුණන ලද බස්රථ සංඛ්‍යාව 1604 ක් හා එහි විකුණුම් වටිනාකම රු.මිලියන 239.28 ක් වූ අතර ගිණුම් අනුව විකුණන ලද බස්රථ සංඛ්‍යාව 1422 ක් හා විකුණුම් වටිනාකම රු.මිලියන 225.93 ක් වී තිබුණි. එහි වෙනස හඳුනාගෙන නිවැරදි කර නොතිබුණි. ඉන් රු.මිලියන 20.37 කට විකුණන ලද බස්රථ 130 ක පිරිවැය හා සමුච්චිත ක්ෂය විකුණුම් ලේඛනයට අනුව පිළිවෙලින් රු.මිලියන 113.08 ක් හා රු.මිලියන 110.37 ක් වූ අතර එය ගර්හිත ලේඛනයට අනුව පිළිවෙලින් රු.මිලියන 139.24 ක් හා රු.මිලියන 135.36 ක් විය.

(ඈ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් ලද තොරතුරු අනුව සිසුසැරිය හා නිසිසැරිය බස් සේවා පවත්වාගෙනයාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම පිළිවෙලින් රු.මිලියන 172.35 ක් හා රු.මිලියන 5.41 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය පිළිවෙලින් රු.මිලියන139.0 ක් හා රු.මිලියන 5.2 ලෙස දක්වා තිබුණි.

(ඉ) බැංකු විසින් සෘජුවම ශේෂය සනාථ කර එවන ලද රු.313,699 ක ස්ථාවර තැන්පතුවක් හා රු155,333 ක ඉතිරිකිරීම් ගිණුම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්වී නොතිබුණි.

(ඊ) ධාවන අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ මුදල් අයකිරීමේ පදනම මත නිකුත් කරන ලද ගමන් බලපත්‍රවල වටිනාකම රු.මිලියන 587.18 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.මිලියන 533.08 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. මිලියන 54.10 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.6 අවිනිශ්චිත ගිණුම්

වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ශේෂය වෙනස් වෙමින් ඉදිරියට ගෙන එමින් පැවති අවිනිශ්චිත ගිණුමක වූ රු.මිලියන 2.35 ක බැර ශේෂයක් හා සමාලෝචිත වර්ෂයට අදාළ රු. මිලියන 23.78 ක ශේෂ ගැලපුම් ගිණුමක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ජංගම නොවන වත්කම් | (i) | ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් වාහන, ගර්හිත වාහන හා අනෙකුත් වත්කම්වල ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා එක් එක් වත්කම් සම්බන්ධ විස්තරාත්මක උපලේඛන. |
| | (ii) | ප්‍රධාන කාර්යාලය ඇතුළු මණ්ඩලයට අයත් සියළුම කාර්යාලවල විධිමත් පරිදි පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛන. |
| | (iii) | ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කිරීමේ ලියවිලි. |
| | (iv) | රු.මිලියන 98 ක් වටිනා අධි සුඛෝපභෝගි බස්රථ 10 ක් මිලදී ගැනීමට අදාළ ඉන්වොයිස් පත්. |
| (ආ) ආයෝජන | | රු. මිලියන 48.31 ක් වූ ස්ථාවර තැන්පත් සහ රු.මිලියන 51.28 ක් වූ ඉතිරි කිරීම්වලට අදාළ ශේෂ සනාථ කිරීම්. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තොගය | | ඩිපෝ 17 ක, ප්‍රාදේශීය වැඩපල 03 ක හා ප්‍රාදේශීය කාර්යාල 02 කට අදාළව රු.මිලියන 108.39 ක් වටිනා තොග සඳහා සමීක්ෂණ වාර්තා. |
| (ඈ) | ඉන්ධන තොගය | | ඩිපෝ 58 ක හා මධ්‍යම බස්රථ කාර්යාලයේ ඉන්ධන ගබඩාවල සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරි රු. මිලියන 24 ක් වටිනා තොග සඳහා සමීක්ෂණ වාර්තා. |
| (ඉ) | විවිධ ණයගැතියෝ | | රු.මිලියන 39.37 ක් සඳහා කේවල ශේෂ ඇතුළත් උපලේඛන හා කාල විශ්ලේෂණ. |
| (ඊ) | වෙළඳ ණයගැතියෝ | | රු.මිලියන 18.28 ක් සඳහා කේවල ශේෂ ඇතුළත් උපලේඛන හා කාල විශ්ලේෂණ. |
| (උ) | වෙනත් ලැබියයුතු ආදායම් | | රු.මිලියන 6.69 ක් සඳහා කේවල ශේෂ ඇතුළත් උපලේඛන . |
| (ඌ) | වෙළඳ ණයහිමියෝ | (i) | ඩිපෝ 31 ක හා ප්‍රාදේශීය වැඩපලවල් 11 කට අදාළ රු.මිලියන 35.33 ක් සඳහා කේවල ශේෂ ඇතුළත් උප ලේඛන හා කාල විශ්ලේෂණ. |
| | | (ii) | රු.මිලියන 698.05 කට අදාළ කාල විශ්ලේෂණ. |
| (එ) | අනෙකුත් ණයහිමියෝ | | රු.මිලියන 19.18 ක් සඳහා කේවල ශේෂ ඇතුළත් උප ලේඛන හා කාල විශ්ලේෂණ. |
| (ඒ) | සේවක තැන්පත් හා අනෙකුත් තැන්පත් | | රු.මිලියන 65.62 ක් වූ සේවක තැන්පත් හා රු.මිලියන 7.9 ක් වූ අනෙකුත් තැන්පත්වලට අදාළ විස්තරාත්මක උපලේඛන හා ලේඛන |
| (ඔ) | බැංකු ශේෂය බැංකු අයිරාව | | රු.මිලියන 74.38 ක් වූ බැංකු ශේෂ 32 ක් සඳහා සහ රු.මිලියන 268.6 ක් වූ බැංකු අයිරා 51 ක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ |

| | | |
|---|---|---|
| (ඕ) | බස්රථ ගර්හිත කිරීම | රු. මිලියන 193.78 ක් වූ බස්රථ 314 කට අදාළ ගර්හිත කිරීම් පිළිබඳ විස්තර. |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්දොස්තර හා මුදල් අයකැමි හිඟ මුදල් පිළිවෙලින් රු.මිලියන 17.18 ක් හා රු.මිලියන 31.85 ක් වන අතර එය පිළිවෙලින් රු.මිලියන 0.87 කින් හා රු.මිලියන 30.31 කින් සමාලෝචිත වර්ෂය තුළදී වැඩි වී තිබුණි. ඇතැම් ශේෂ වසර ගණනාවක සිට ඉදිරියට එමින් පැවතුන ද එම මුදල් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද ඩිපෝවන්හි මාර්ග ලේඛන පරීක්ෂා කිරීම යාවත්කාලීන නොකිරීම නිසා එම ශේෂයන්හී නිවැරදිතාවයද තහවුරු නොවීය.

(ආ) බදුල්ල ඩිපෝවේ 2012 වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ඇතැම් දිනවල දෛනික ආදායම බැංකුගත නොකර එම ආදායමෙන් ඉන්ධන හා වැටුප් ගෙවීම සඳහා යොදාගත් රු.මිලියන 29.53 ක මුදලක්ද ඉහත අයකැමි හිඟ මුදල තුළ ඇතුළත්ව ඇති අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සුනාමි අරමුදල සඳහා මණ්ඩලයේ සේවකයින්ගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 1.80 ක් අදාළ අරමුදල වෙත නොයවා රඳවාගෙන තිබුණි.

(ඈ) සේවක දඩ අරමුදල් ගිණුමෙන් සේවකයින්ට දෙනු ලැබූ ණය මුදලින් ආපසු අයකරගත් රු.මිලියන 304.61 ක් වූ ණය වාරික එම අරමුදලට බැර නොකර මණ්ඩලය තුළ රඳවාගෙන තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ (8)(1), (8)(3) හා 11 වගන්ති සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1, 5.2.4 , 5.2.5 හා 8.2.2 ඡේද | (i) | ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු අතර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 පෙබරවාරි 15 දිනදීය. |
| | (ii) | ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවලට අනුකූල වන පරිදි අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |
| | (iii) | එකතුව රු. මිලියන 630.55 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.1.ඡේදය | | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2006 ඔක්තෝබර් 09 දිනැති අංක පීඩී/39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1 හා 2 ඡේද | (i) | නිල වාහන ලබා ගැනීමට හිමිකම් නොමැති නිලධාරීන් 12 දෙනෙකුට නිල වාහන ලබාදී තිබුණි. |
| | (ii) | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව හා මිල ගණන් කැඳවීමකින් තොරව කුලී පදනම මත වාහන 08 ක් ලබාගෙන තිබුණි. |
| | (iii) | මණ්ඩලයේ කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබියදී කුලී වාහන 08 ක් ලබාගෙන ඉන් 05ක් වාහන හිමිකම් නොමැති නිලධාරීන් 05 දෙනෙකු වෙත අනුයුක්ත කර තිබුණි. |
| (ඈ) 2010 ජූලි 12 දිනැති අංක ශ්‍රීලංගම/ ප්‍රකා/ නිසා(කා)2010/18 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) ගේ ලිපිය | | වෙස්කෝ සමාගමට යවා ඇති බස්රථ 143 ක් රථ ඇණියෙන් ඉවත් කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

-------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රු. මිලියන 3,966.53 ක අලාභයක් ලබා තිබුණු අතර භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 1,508.19 ක ප්‍රදාන හේතුවෙන් එම අලාභය රු. මිලියන 2,458.34 දක්වා අඩුවී තිබුණි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. මිලියන 3,491.22 ක අලාභයක් ලබා තිබුණු අතර භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 1,153.6 ක ප්‍රදාන හේතුවෙන් එම අලාභය රු. මිලියන 2,337.62 දක්වා අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 120.72 ක පිරිහීමක් පෙන්නුම් කරන අතර මෙහෙයුම් වියදම සියයට 23 කින් හා අනෙකුත් ස්ථාවර වියදම සියයට 13 කින්ද වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

--------------------------------------------------------------------------------------

ආයතනය විසින් බස්රථවලට සිදුවී ඇති අනතුරු සම්බන්ධයෙන් බාහිර ආයතන 02 කට එරෙහිව රු.702,310 ක වන්දි ඉල්ලා නඩු 02 ක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

4.1 කාර්ය සාධනය

------------------

(අ) සැළසුම් හා පර්යේෂණ අංශය ඉදිරිපත් කරන ලද තොරතුරු හා දත්ත අනුව මණ්ඩලයේ 2012 වර්ෂයේ බස් ධාවනය පිළිබඳ කාර්ය සාධනය පසුගිය වර්ෂ 03 ක දත්ත සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| | -------- | --------- | -------- | -------- |
| බස්රථ ඇණිය | 7756 | 7821 | 8403 | 9125 |
| කාල සටහන් අනුව බස්රථ අවශ්‍යතාවය (සාමාන්‍ය) | 7172 | 7131 | 7129 | 7134 |
| දිනකට ධාවනය සඳහා සපයා ඇති බස්රථ සංඛ්‍යාව | 4694 | 4933 | 5119 | 4984 |
| කාලසටහන් අවශ්‍යතාවයෙන් ධාවනය කරන ලද බස්රථ ප්‍රමාණයේ ප්‍රතිශතය | 61% | 60% | 61% | 62% |
| වර්ෂය තුළ ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝ මීටර් ප්‍රමාණය | 609,651,210 | 611,411,135 | 616,363,455 | 598,280,260 |
| ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය | 337,830,439 | 340,840,718 | 341,617,984 | 335,861,305 |
| සේවක සංඛ්‍යාව (සාමාන්‍ය) | 34092 | 34263 | 34772 | 35365 |
| ධාවන තත්ත්වයේ ඇති එක් බස්රථයකින් යැපෙන සේවකයින් සංඛ්‍යාව | 7 | 7 | 7 | 7 |

මණ්ඩලය සතු මුළු බස්රථ සංඛ්‍යාව 2008 වර්ෂයේදී 9326 ක් ව පැවතියද පසුගිය වර්ෂ 05 තුළ බස්රථ ඇණිය ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කළ අතර 2008 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සියයට 16.83 කින් පහත බැස තිබුණි. එසේම එම බස්රථ ඇණියෙන් ධාවන තත්ත්වයේ පැවතියේ සියයට 61 ක් පමණක් වූයෙන් ඉන් කාලසටහන් අවශ්‍යතාවයවත් සපුරාගත නොහැකි තත්ත්වයක් පැවතුණි. තවද පසුගිය වර්ෂ 05 තුළ මණ්ඩලට බස් රථ ධාවනය කිරීමට හැකිව තිබුණේ ඉලක්ක කරගත් කිලෝමීටර් ප්‍රමාණයෙන් සියයට 55ක් පමණි. මේ නිසා මණ්ඩලයේ ආදායම් තත්ත්වය ඉතා අඩු මට්ටමක පැවතියද 2012 වර්ෂය වන විට එක් බස් රථයකින් යැපෙන සේවක සංඛ්‍යාව 07 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රගතිය පසුගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| කිලෝ මීටරයකට මගීන් ප්‍රවාහනයෙන් ලද ආදායම | 53.90 | 44.26 |
| කිලෝමීටරයකට මුළු ආදායම(රජයේ ප්‍රදානද ඇතුළුව) | 77.86 | 66.07 |
| කිලෝමීටරයකට මුළු වියදම(ක්ෂයවීම් ඇතුළුව) | 85.24 | 69.81 |
| කිලෝ මීටරයකට මෙහෙයුම් අලාභය (රජයේ ප්‍රදාන වලට පෙර) | 25.14 | 19.45 |
| කිලෝ මීටරයකට මුළු අලාභය(රජයේ ප්‍රදාන වලින් පසු) | 7.38 | 3.74 |

සමාලෝචිත වර්ෂයේදී මගී ප්‍රවාහනයෙන් ලද ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 18 කින් වැඩිවී තිබුණද මුළු වියදමද සියයට 21 කින් වර්ධනය වී තිබුණෙන් ආදායම වර්ධනය වන වේගයට වඩා වැඩි වේගයකින් වියදම වර්ධනය වන බැවින් ආයතනය දිගින් දිගටම පාඩු ලබමින් පැවතුණි.

(ඇ) 2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව ග්‍රාමීය ප්‍රදේශවල මහජනතාවගේ අවශ්‍යතාව සඳහා ණය සහන පදනම මත "ඊ"මාදිලියේ කුඩා බස්රථ 200 ක් ද "බී" මාදිලියේ බස්රථ 200 ක්ද මිලට ගැනීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණේ "ඊ" මාදිලියේ බස්රථ 04 ක් හා "බී" මාදිලියේ බස්රථ 04 ක් පමණි.

4.2 අරමුදල් උපයෝජනයේ අකාර්යක්ෂමතා
--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථා මාලාව හා රෙගුලාසි සහ 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ අරමුදල් පනත්වල ඇති විධිවිධාන පරිදි සමාලෝචිත වර්ෂය අවසන් දිනට මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට බැර කළයුතු පිළිවෙලින් රු.මිලියන 491.65 ක් හා රු.මිලියන 3,217.12 ක් ඒ ඒ වර්ෂවල නියමිත දිනට ගෙවීම් නොකර වර්ෂය අවසන් වනතෙක් මණ්ඩලය විසින් රඳවාගෙන තිබුණි. මෙපරිද්දෙන් වර්ෂය අවසානයට බැර නොකළ සේවක භාරකාර අරමුදල් දායකය රු.මිලියන 49.3 ක් වූ අතර නිසිකලට දායක මුදල් නොගෙවීම නිසා ගෙවිය යුතු අධිභාරය රු.මිලියන 13.78 ක් විය. දායක මුදල් කලට

වේලාවට නොගෙවීම නිසා සියයට 5 සිට 50 දක්වා අධිභාර මුදල් ගෙවිය යුතු වන අතර මේ නිසා ඇතිවී ඇති අධිකරණමය කටයුතු වෙනුවෙන් ගෙවීමට සිදුවිය හැකි නෛතික ගාස්තු වෙනුවෙන් ද වෙන් කිරීමක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවකයින්ගෙන් අයකරගන්නා ලද ආරක්ෂක ඇප තැන්පත් බාහිර ආයතනයක ආයෝජනය කළයුතු වුවත් රියදුරන් හා කොන්දොස්තරවරුන්ගෙන් අයකරගන්නා ලද රු.මිලියන 65.6 ක මුදලින් ආයෝජනය කර ඇත්තේ රු.මිලියන 4.63 ක් වන අතර ඉතිරිය මණ්ඩලයේ මුදල් අවශ්‍යතාවයන් සඳහා යොදවාගෙන තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඔරුගොඩවත්ත හා රත්මලාන ඉන්ධන පිරවුම්හල් සඳහා අවශ්‍ය ඉන්ධන තොග ඛණිජතෙල් නීතිගත සංස්ථාවට මුදල් ගෙවීමකින් තොරව ලබා නොදෙන බව දක්වමින් ඉදිරි සති දෙකක පමණ කාලයක් සඳහා ඉන්ධන ලබාගැනීමට අවශ්‍යවන මුදල් වෙනුවෙන් චෙක්පත් ලියා ඉන්ධන පිරවුම්හල්වල කළමනාකරුවන් අතට ලබාදෙන ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ඔරුගොඩවත්ත හා රත්මලාන ඉන්ධන පිරවුම්හල් සඳහා පිළිවෙලින් රු.මිලියන 10.18 ක් වටිනා චෙක්පත් 15 ක්ද රු.මිලියන 7.86 ක් වටිනා චෙක්පත් 11ක් ද ඉන්ධන පිරවුම්හල් කළමනාකරුවන් අත රඳවාගෙන තිබුණි. මෙම සියළුම චෙක්පත්වල වටිනාකම මාර්ගස්ථ ඉන්ධන තොග ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) ණය සහන පදනම මත මිලදී ගන්නා ලද බස්රථ සඳහා වූ වාරික මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීම සඳහා සහ ඩිපෝවලින් ලැබෙන වාරික මුදල් වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීම වැළැක්වීමේ අරමුණින් ඒ සඳහාම වෙන්වූ ජංගම ගිණුමක් ආරම්භකර තිබුණි. එහෙත් එම අරමුණට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 75.07 ක මුදලක් මණ්ඩලයේ මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා වෙනත් ගිණුම්වලට මාරුකර තිබුණි. මෙය ආයතනයේ පවතින මුදල් දුෂ්කරතාවය නිසා තාවකාලික මුදල් හුවමාරුවක් ලෙස මණ්ඩලය විසින් පෙන්වා දුන්නද මේ නිසා මෙම ගිණුම පිහිටුවීමේ අරමුණ ඉටුකරගත නොහැකිවී තිබුණි.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) මුදල් අයකිරීමේ පදනම මත නිකුත් කරනු ලබන ගමන් බලපත්‍ර පිළිබඳ විස්තර ධාවන අංශය විසින් මුදල් අංශය වෙතත් ඒ සඳහා අයවීම් පිළිබඳ විස්තර මුදල් අංශය මඟින් ධාවන අංශය වෙතත් දැනුවත් කිරීමට කළමනාකරණය විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම නිසා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම මුදල් අයවීම පිළිබඳ පසු විපරම් කිරීමක් සිදුකිරීම මෙම අංශ දෙකින්ම සිදු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයට අයත් බස්රථවල ගමන්කිරීම සඳහා පොලිස් නිලධාරීන් වෙත නිකුත්කරන ලද පොලිස් වොරන්ට් පත්‍ර වෙනුවෙන් පොලිස් දෙපාර්තමේන්තුවෙන් මුදල් අයකරගැනීම සඳහා එක් එක් ඩිපෝවට ලැබී ඇති මෙම බලපත්‍ර නොපමාව ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බැවින් සියළුම පොලිස් වොරන්ට් පත්‍ර ප්‍රධාන කාර්යාලයට එවන බවටත් ඒවා සඳහා මුදල් අයවන බවටත් තහවුරු කරගත නොහැකි විය.

(ඇ) ආරම්භයේ සිටම මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි ලේඛනගත නොවීම නිසා ඒ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට පියවර ගන්නා බව විගණන විමසුම්වලට පිළිතුරු වශයෙන් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදීද ප්‍රකාශකර තිබුණද 2015 ජූනි මස අවසන් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ විවිධ අංශ වෙතින් ගිණුම් තැබීම සඳහා අවශ්‍ය තොරතුරු අදාළ ගනුදෙනු සිදුවන අවස්ථාවේදීම ගිණුම් අංශය වෙත යොමුවන ආකාරයට කටයුතු නොකිරීම නිසාත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වසර දෙකකට වැඩිකාලයක් ප්‍රමාදවීමත් යන හේතු නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත අඩුපාඩු ද ඇතිවී තිබුණි.

(i) ගිණුම්වලින් මගහැරීම

(ii) අඩුවෙන් ගිණුම්ගත කිරීම

(iii) එක් එක් අංශවල තොරතුරු නොසැසඳීම

(iv) ඇතැම් බස්රථ වාර කිහිපයක් ගර්හිත කිරීම

විගණනයේදී අනාවරණය වූ මෙම කරුණු විවිධ අවස්ථාවන්හිදී විගණන විමසුම් මඟින් හා විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණද එම තත්ත්වයන් නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ණය සහන පදනම මත මිලදී ගත් බස්රථ 300ට අදාළව සැපයුම්කරුවන් සමඟ අත්සන් කරන ලද ගිවිසුමේ 5(3) වගන්තිය ප්‍රකාරව වසර 10 ක් යනතුරු අමතර කොටස් ලබාදීමට එකඟවී තිබුණි. වගකීම් කාලය තුළදී බස්රථයක් සඳහා අළුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් සැපයුම්කරුවන්ට ලබා නොදීම හේතුවෙන් ඒ සඳහා රු.87,020 ක මුදලක් ඩිපෝවක් මඟින් වැයකර තිබුණි.

(ඊ) ඉහත ගිවිසුමේ 5(4) හා 5(7) යන වගන්ති ප්‍රකාරව මිලදී ගත් බස්රථ නඩත්තු කිරීම සම්බන්ධයෙන් කාර්මික දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහනකට සේවකයින් පිරිසක් සහභාගි කරවීමට එකඟ වී තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ බස් ධාවනය ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් 2011 සැප්තැම්බර් 13 දින හා 2012 පෙබරවාරි 15 දින පැවති කමිටු රැස්වීම් මඟින් බස්රථ 04 ක්ද 2012 ජූනි 26 දින පැවති කමිටු රැස්වීමේදී බස්රථ 04 ක්ද 2012 ජූලි 17දින පැවති කමිටු රැස්වීමේදී බස්රථ 02 ක්ද වශයෙන් බස්රථ 10 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණද අවසන් කමිටු රැස්වීම් පැවැත්වීමට පෙර එනම් 2012 මාර්තු 14 වන විට බස්රථ 11ක් මිළදී ගෙන තිබුණි. මෙම සියළුම බස්රථ ණය සහන පදනම මත මිලදී ගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඌ) 2011 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව මිලට ගැනීමට අනුමත “බී” මාදිලියේ බස්රථ 300කින් 162 ක් 2011 වර්ෂයේද 138 ක් 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබූ අතර එම බස්රථ 300 න් 291ක්ම මණ්ඩලයට ලැබෙන තෙක් සැපයුම්කරු සමඟ ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2007 සිට 2012 දක්වා ගර්භිත කරන ලද නමුත් 2012 වර්ෂය අවසන් වන විටත් නොවිකිණි ඉතිරිවූ පිරිවැය රු.මිලියන 1,090.85 ක් හා සමුච්චිත ක්ෂය රු.මිලියන 1,052.99 ක් වූ බස්රථ 1,519 ක් විකුණා අවසන් කිරීමට කළමනාකරණය අපොහොසත්වී තිබුණි.

(ඒ) තොග සමීක්ෂණයේදී අනාවරණය වූ රු.මිලියන 3.28 ක තොග ඌනතා හා රු.මිලියන.4.88 අතිරික්ත සම්බන්ධයෙන් කළමනාකරණය විසින් විමර්ශනයක් කර ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4.4 ආර්ථික නොවන ගනුදෙනු

-------------------------------

මණ්ඩලය විසින් බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 111.86 ක් බැංකු අයිරා පොළිය වශයෙන් ගෙවා තිබුණි. මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 99 ක වැඩිවීමකි.

4.5 වෙනත් රාජ්‍ය ආයතනයන් වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

--------------------------------------------------------------------

2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව ප්‍රධාන කාර්යාලයේ වාහන 02 ක් රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුව මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් සහ අනුමත කාර්ය මණ්ඩලයක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ආ) ධාවනයට සපයන ලද බස් රථ 5,500 ක් පදනම් කරගෙන එක් බස්රථයකට සේවක සංඛ්‍යාව 5.6 යන පදනම මත 2008 වර්ෂයේදි පිළියෙල කරන ලද යෝජිත කාර්ය මණ්ඩල ව්‍යුහයක් පමණක් මණ්ඩලය සතුව පැවතුණි. ඒ අනුව යෝජිත සේවක සංඛ්‍යාව 30,250 ක් විය යුතු වුවද යෝජිත ව්‍යුහය පිළියෙල කිරිමේදි 30,554 දක්වා වැඩිවී තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 33,731ක් වූයෙන් 3,177 ක සේවක අතිරික්තයක් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළදී ධාවනයට සපයන ලද සාමාන්‍ය බස්රථ සංඛ්‍යාව 4,694 ක් වූ අතර ඒ අනුව ධාවනය වන එක් බස් රථයක් සඳහාවූ සේවක සංඛ්‍යාව 7 ක් වී තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් සමඟ ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත්, 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 02 කුත් මාස 02 ක් ප්‍රමාද වී එනම් 2015 මැයි 18 දින වන අතර වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් එම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම
---------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව 2012 – 2016 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර එහි පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් එය ඉදිරිපත් කර තිබුණේ මාස 04 ක් ප්‍රමාදවී එනම් 2012 අප්‍රේල් 26 දිනදීය.

5.3 ක්‍රියාකාරී සැලැස්ම
---------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අරමුණු හා ඉලක්ක ළඟාකර ගත හැකි ප්‍රායෝගික සැලැස්මක් නොවන බව නිරීක්ෂණය විය.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.2. (අ) ඡේදය ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා සංසන්දනය කිරීමේදී සියයට 4 සිට සියයට 98 දක්වා වූ පරාසයක් තුළ විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින්වර වාර්තා කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) තොග පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ණයගැතියෝ හා ණයහිමියෝ

(ඉ) ගිණුම් ශේෂ තහවුරු කිරීම

(ඊ) අයවැය පාලනය